**30-07-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, දුක නිමවන සතුට ගෙනන කෙනා වන්නේ පරමාත්ම පියා පමණි. ඔබේ සියලු දුක් දුරු කරනුයේ පියා පමණි. කිසිවකුගේ දුක දුරුකරලීමට මනුෂ්‍යයෙකු හට නොහැකිය.

**ප්‍රශ්නය:** ලෝකය සාමයෙන් තොර වීමට හේතුව කවරේද? සාමය ස්ථාපිත වනුයේ කෙසේද?

**පිළිතුර:** ලෝකය සාමයෙන් තොර වීමට හේතුව අනේක විධ වූ ආගම් වේ. කලියුගය අවසානයේදී මෙම බෙදීම ඇති වූ විට එතැන සාමය තොර වේ. පියා පැමිණ සැබෑ ආගම ස්ථාපිත කළ විට සාමය ස්ථාපිත වේ. ලක්ෂ්මී නාරායන රාජධානියේ සාමය තිබූ බව ඔබට වටහා ගත හැකිය. පිරිසිදු ආගම හා පිරිසිදු ක්‍රියාව එහි තිබුණි. යහපතම කරන පියා ඒ නව ලෝකය නැවතත් නිර්මාණය කරමින් සිටී. එහි සාමයෙන් තොර වීම පිළිබඳ සඳහනක්වත් නොමැත.

ඕම් ශාන්ති. අධ්‍යාත්මික පියා අධ්‍යාත්මික දරුවන් වන ඔබට මෙතැනට විත් සියලු දේ තේරුම් කරයි. ඥාන සාගරය යැයි හැඳින් වූයේ අධ්‍යාත්මික පියා පමණි. මෙය ඔබට තේරුම් කර දී ඇත. බොම්බේ වල දිගින් දිගටම රැස්වීම් පවත්වන සමාජ සේවකයින් ඇත. බොම්බායේ මෙම රැස්වීම් පවත්වන ස්ථානය භාරතීය විද්‍යාභවන් යැයි හැඳින්වේ. ඥානයේ වර්ග දෙකකි. එකක් නම් පාසල් සහ විද්‍යායතන වලදී ලැබෙන ලෞකික ඥානයයි. ඔවුන් එයට විද්‍යාභවන් (දැනුම) යැයි කියයි. එහි තවත් දෙයක් තිබිය යුතුය. ඥානය යනු කුමක් දැයි මිනිසුන් නොදනී. මෙය වූකලී අධ්‍යාත්මික ඥානභවන් විය යුතුය. ග්‍යාන් යනු ඥානයයි. ඥාන සාගරය වනුයේ උත්තරීතර පියා වන උත්තරීතර ජීවාත්මය පමණි. ඥාන සාගරය ක්‍රිෂ්ණා විය නොහැක. ශිව බාබා පිළිබඳ පැසසුමත් ක්‍රිෂ්ණාගේ පැසසුමත් එකිනෙක වෙනස්ය. භාරතයේ මිනිසුන් පැටලැවිල්ලකට පත්ව ඇත. ඔවුන් ක්‍රිෂ්ණා, ගීතාවේ දෙවියන් යැයි සලකා විද්‍යා භවන් (ඥානය දෙන ස්ථානය) විවෘත කරයි. ඔවුන්ට කිසිවක්ම නොතේරේ. ඒ ඥානය ගීතාවේ ඥානයයි. ඒ ඥානය ඇත්තේ ඥාන සාගරය වන පියාටම පමණි. මිනිසුන් මෙය නොදනී. සත්‍ය වශයෙන්ම සියලු ආගමික ලේඛන අතර මාණික්‍යය වන එකම භගවත් ගීතාව භාරතයේ මිනිසුන්ගේ ආගමික ලේඛනය වේ. භගවත් හෙවත් දෙවියන් යනුවෙන් හැඳින්විය හැක්කේ කවුද? මෙකල භාරතීයයන් මෙය තේරුම් ගෙනවත් නැත. ඔවුන් ක්‍රිෂ්ණා හෝ රාමා හෝ තම තමන් උත්තරීතර යැයි කියයි. මේ තමෝප්‍රධාන් කාල සීමාවයි. රාවණ රාජ්‍යයයි. ඔබ කාට හෝ මෙය තේරුම් කරනා විට මෙසේ කියන්න. මෙය ශිව බාබා කතාකර කියූ දේය. පළමුවෙන් ඔවුන් තේරුම් ගත යුත්තේ උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය ඥාන සාගරය වන බවත් ඔහුගේ නම ශිවා බවත්ය. මිනිසුන් ශිව රාත්‍රී උත්සව පැවැත් වූවත් කිසිවෙකුට තේරුම් ගැනීමේ හැකියාවක් නැත. ශිවා පැමිණ ඇති බව ස්ථිරය. ඔහුගේ රාත්‍රිය සමරණුයේ එබැවිනි. ඔවුන් ශිවා යනු කවුරුන්ද කියාවත් නොදනී. පියා මෙසේ කියයි සියලු දෙනාගේ දෙවියා එකය. අනෙක් ජීවාත්මයන් සියලු දෙනා සහෝදරයන්ය. සියලු ජීවාත්මයන්ගේ පියා එම උත්තරීතර පියාය. උත්තරීතර ජීවාත්මයයි. ඥාන සාගරයයි. මේ ඥානය දෙවි දේවතාවන්ට නැත. කුමන ඥානයද ? කිසිදු මනුෂ්‍යයෙකුට නැති නිර්මාපකයා පිළිබඳ හා නිරමාණයේ මුල, මැද සහ අග පිළිබඳ ඥානයයි. පුරාණ ඍෂිවරු හා මුණිවරුත් මෙය නොදන්නා බව ඔවුන් කියයි. පුරාණ යන්නෙහිවත් තේරුම ඔවුන් නොදනී. පුරාණ යන්නෙහි තේරුම සත් යුගය හා රිදී යුගය වේ. සත් යුගය වූ කලී නව ලෝකයයි. ඍෂිවරු හා මුණිවරු එහි නොසිටියහ. සියලු ඍෂිවරු හා මුණිවරු පැමිණියේ පසුවයි. ඔවුන්ට ද මේ ඥානය නොමැත. ඔවුන් සරල ලෙස නැත නැත (එයත් නොවේ මෙයත් නොවේ) යනුවෙන් පවසයි. ඔවුන්වත් නොදනීනම් දැන් තමෝ ගුණී වී ඇති භාරතයේ මිනිසුන් දන්නේ කෙසේද? මෙකල විද්‍යාවේ මානාධික බව ඉහළ වේ. වර්තමානයේ විද්‍යාවෙන් භාරතය දෙව් ලොවක් වී ඇතැයි ඔවුන් විශ්වාස කරයි. එය වූ කලී මායාගේ පම්පෝරියයි. 'පොම්පේ නගරය වැටීම' යනුවෙන් නාට්‍යයක් ද ඇත. මෙකල භාරතයේ වැටීමක් ඇතැයිද ඔවුන් කියයි. සත් යුගය වූ කලී නැඟීමයි, දැන් ඇත්තේ වැටීමයි. මෙය දෙව් ලොව නොවේ. මෙය මායාගේ පම්පෝරියයි. එය විනාශ විය යුතුව ඇත. මිනිසුන් හිතන්නේ අහස්යාත්‍රා, මාලිගා හා විදුලි පහන් තිබෙන නිසා මෙය දෙව් ලොව කියාය. කෙනෙක් මළ විට නම් ඔහු දිවංගත වී යැයි කියයි. ඔහු දෙව් ලොව ගොස් ඇත්නම් දෙව් ලොව ඇත්තේ වෙනත් තැනක යැයි මෙයින් හෝ ඔවුන් තේරුම් ගෙන නොමැත. මෙය රාවණගේ පම්පෝරියයි. අසීමිත පියා දෙව් ලොව ස්ථාපිත කරයි. මේ කාලයේ දි මායා සහ දෙවියන් අතරත් යක්ෂ ලෝකය සහ දේවමය ලෝකය අතරත් කඹ ඇදීමක් ඇත. භාරත ලෝකයේ මිනිසුන්ට මෙය තේරුම් කර දිය යුතුව ඇත. තව තවත් බොහෝ

දුක් පැමිණීමට තිබේ. දුක බොහෝ වෙයි. දිව්‍යලෝකය ඇත්තේ සත් යුගයේ පමණයි. කලි යුගයේ දිව්‍යලෝකය තිබිය නොහැකියි. වඩාත්ම සුබ සංගම් යුගය කිසිවෙක් නොදනී. පියා මෙසේ විස්තර කරයි. ඥානය දහවල වන අතර භක්තිය රාත්‍රියයි. ඔවුන් අඳුරේ අතපතගායි. ඔවුන් වේද සහ නොයෙක් ග්‍රන්ථ දෙවියන් හමුවීම සඳහා උගනී. බ්‍රහ්මාගේ දහවල සහ රැය බ්‍රාහ්මින්ලාගේද දහවල සහ රැය වේ. මුඛයෙන් උපදින සැබෑ බ්‍රාහ්මින්ලා වනුයේ බ්‍රාහ්මින්වරු වන ඔබයි. අනෙකුත් බ්‍රාහ්මණයින් කලි යුගයේ භෞතික නිර්මාණයන්ය. ඔබ වඩාත්ම සුබ සංගම් යුග බ්‍රාහ්මින්වරුන් වේ. කිසිවෙක් මේවා නොදනී. ඔවුන්ගේ බුද්ධියට ඔවුන් කරන දේ වැටහෙන්නේ මේවා තේරුම්ගත් පසුවයි. දෙව් ලොව යැයි හැඳින්වෙන භාරතය සතෝප්‍රධාන්ව තිබිණ. මෙය දැන් නිශ්චිතවම අපාය වන අතර ඔවුන් අපායෙන් දෙව් ලොව යනවා යැයි කියනුයේ එහෙයිනි. එහි සාමය සහ සතුට ඇත. එය වූ කලී ලක්ෂ්මී නාරායන්ගේ රාජ්‍යයයි. ඔබට තේරුම් කළ හැකියි මිනිස් ජනගහණය අඩු කරන්නේ සහ සාමයෙන් තොර බව අඩු කරන්නේ කෙසේද කියා. මෙම ජරාජීර්ණ කලි යුගයේ ඇත්තේ සාමයෙන් තොර බවයි. නව ලෝකයේ පමණයි සාමය ඇත්තේ. දෙව් ලොව සාමය ඇත. එයට කියනුයේ ආදි සනාතන දෙව් දේවතා ධර්මය කියායි. වර්තමානයේ ඇත්තේ හින්දු ආගමයි. එයට ආදී සනාතන දහම යැයි කිව නොහැක. හින්දුස්ථානය යන නම නිසා ඔවුන් හින්දූන් ලෙස හැඳින්වේ. එහි තිබී ඇත්තේ ආදී සනාතන දෙව් දේවතා ධර්මයයි. එහි සම්පූර්ණ පවිත්‍රත්වය, සතුට, සාමය, සෞඛ්‍ය සහ ධනය තිබිණ. දැන් මිනිසුන් මෙසේ හඬ නඟයි. අපි පව්කාරයෝය! පවිත්‍රකරුවාණෙනි, පැමිණෙන්න! පැන නඟින ප්‍රශ්නය මෙයයි පවිත්‍රකරුවා කවුද? ක්‍රිෂ්ණා එසේ විය නොහැකියි. ඥාන සාගරය, උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය පමණි පවිත්‍රකරුවා වන්නේ. ඥානය යනු අධ්‍යයනයයි. සියල්ල පවතින්නේ ගීතාව මතයි. ඔබ දැන් කෞතුකාගාර සහ ප්‍රදර්ශන ආදිය පැවැත්විය යුතුය, නමුත් මිනිසුන් තවමත් බීකේවරුන් යන්නෙහි අර්ථය තේරුම් ගෙන නොමැත. ඔවුන් හිතන්නේ එය තවත් නව ආගමක් කියාය. ඔවුන් ඇහුම්කන් දුන්නා වුවද කිසිවක් තේරුම් නොගනී. පියා මෙසේ කියයි ඔවුන්ට ඇත්තේ සම්පූර්ණ තමෝප්‍රධාන් ගල් බුද්ධියක්. මෙකල බොහෝ අයට ඇත්තේ විද්‍යාව ගැන අහංකාරකමයි. ඔවුන් විද්‍යාව තුළින්ම විනාශ වන අතර ඔවුන්ට කිව හැක්කේ ගල් වූ බුද්ධිය කියාය. ඔවුන්ට දිව්‍යමය බුද්ධියක් ඇතැයි කිව නොහැක. ඔවුන් ඔවුන්ගේම විනාශය සඳහා බෝම්බ සාදයි. ශංකර් විසින් විනාශය කරවන්නේ නැත. ඔවුන් විසින් ඔවුන්ගේ විනාශය කරගනී. කොහොමනමුත්, තමෝප්‍රධාන් බුද්ධිය ඇති අය මේවා අවබෝධ කර නොගනී. ඔවුන් සාදන සියල්ල මේ පැරණි ලෝකයේ විනාශය සඳහාය. විනාශය සිදු වූ කල පමණි නව ලෝකය ජය ගැනීම සිදුවනු ඇත්තේ. ඒ මිනිසුන් කාන්තාවන්ගේ දුක නැති කළ හැක්කේ කෙසේදැයි සැළකිල්ල දක්වයි. පියා පමණි දුක නිවන්නා සහ සතුට ළඟා කරන්නා වන්නේ. දෙව් දේවතාවන් වුවත් එසේ නොවේ. ක්‍රිෂ්ණාද දේවතා කෙනෙකි. ඔහුට දෙවියන් යැයි කිව නොහැකිය. ඔවුන්ට කිසිවක් අවබෝධ නොවේ. තේරුම් ගන්නා අය පමණක් බ්‍රාහ්මින් වන අතර ඔවුන් අන් අයට විස්තර කර දේ. රාජකීයත්වය හිමි ආදී සනාතන දෙව් දේවතා ධර්මයට අයත් අය මතුවනු ඇත. ලක්ෂ්මී නාරායන්ට දෙව් ලොව හිමි වූයේ කෙසේද? ලෝකයේ හිමිකරුවන් වීමට ඔවුන් කළේ කුමක්ද? කලි යුගයේ අවසානය වන මෙකල බොහෝ ආගම් ඇති අතර සාමයෙන් තොර බවද ඇති වේ. නව ලෝකයේදී එසේ නොවේ. පියා පැමිණ රාජයෝගා උගන්වන සංගම් යුගය වර්තමානයයි. සුකර්ම, විකර්ම සහ අකර්ම පිළිබඳ ඥානය ලබා දෙන්නේ පියා පමණි. ජීවාත්මයන් පැමිණ ක්‍රියාවන් කිරීමට ශරීර ලබා ගනී. සත් යුගයේදී මිනිසුන් කරන ක්‍රියා සියල්ල අකර්මය. එහිදී විකර්ම කිරීමක් නැත. එහි දුකද නැත. පියා පමණි මෙහි පැමිණ ඔබට මෙම සුකර්ම, අකර්ම සහ විකර්ම ගැන රහස් කියා දෙන්නේ. මා මොහුගේ උපත්වල අවසානයේදී පැමිණෙමි. මම මේ රථයට ඇතුළු වීමි. මෙය අමරණීය ප්‍රතිමූර්තිය වන ජීවාත්මයේ රථයයි. එය අම්රිත්සා වලදී පමණක් නොවේ. සැම මනුෂ්‍යයෙකුටම අමරණීය සිහසුනක් තිබේ. ජීවාත්මය වූ කලී අමරණීය ප්‍රතිබිම්භයයි. මෙම ශරීරය ගමන් කරයි. කතා කරයි. මෙය අමරණීය ජීවාත්මයේ සජීවී සිහසුනයි. සියලු දෙනා අමරණීය ප්‍රතිබිම්භ වන නමුත් ශරීරයට මරණය සිදු වේ. ජීවාත්මය අමරණීය වේ. ඔවුන් සිහසුන විනාශ කර දමයි. සත් යුගයේදී බොහෝ සිහසුන් නැත. මේ කාලයේ දී මිලියන ගණන් ජීවාත්මයන් වල සිහසුන් ඇත. ජීවාත්මය පමණි අමරණීය වන්නේ. තමෝප්‍රධාන් බවේ සිට සතෝප්‍රධාන් බවට පත් වන්නේ මෙම ජීවාත්මයයි. මා සදාකාලිකව සතෝප්‍රධාන්ය. පවිත්‍රය. ඔවුන් භාරතයේ පැරණි යෝගා ගැන කතා කළත් ඔවුන් හිතන්නේ ඒවා ඉගැන්වූයේ ක්‍රිෂ්ණා කියාය. ඔවුන් ගීතාව මිත්‍යාවක් බවට හරවයි. ඔවුන් චරිතයේ නම වෙනස්කර ඇත. පියාගේ නම වෙනුවට දරුවාගේ නම ඇතුලත් කර ඇත. ඔවුන් ශිවාගේ රාත්‍රිය සැමරුවත් ඔහු ආවේ කෙසේදැයි නොදනී. ශිවා වූකලී උත්තරීතර ජීවාත්මයයි. අන් ජීවාත්මයන්ට වඩා ඔහුගේ පැසසුම වඩාත් වෙනස්ය. රාධා සහ ක්‍රිෂ්ණා ලක්ෂ්මී සහ නාරායන් වන බව දරුවන් වන ඔබ දනී. ලක්ෂ්මී නාරායන්ගේ ද්විත්ව ස්වරූපය විෂ්ණු ලෙස හඳුන්වයි. වෙනසක් නැත. නමුත් අත් හතරක් හෝ අටක්

ඇති මනුෂ්‍යයන් නොමැත. ඔවුන් අත් බොහෝ ඇති දේවිවරුන් පෙන්වා ඇත. මෙය විස්තර කිරීමට කාලය අවශ්‍යයි. පියා මෙසේ කියයි. මම දුප්පතුන්ගේ ස්වාමියායි. මම පැමිණෙන්නේ භාරතය දුප්පත් වී රාහු ග්‍රහයා ලැබූ විටය. බ්‍රහස්පතිගේ බැල්ම තිබුණු අතර, දැන් භාරතය සහ මුළු ලොවම රාහු විසින් වසාගෙන ඇත. පියා භාරතයට එන්නේ ඒ නිසාය. ඔහු පැමිණ දෙව් ලොව යැයි හැඳින්වෙන නව ලෝකය සාදයි. දෙවියන් කතා කරයි. මම ඔබ රජවරුන්ගෙත් රජවරු බවට පත් කරවමි. මම ඔබව දෙව් ලොව ඔටුනු දෙකක් ඇති අය බවට පත් කරවමි. ආදි සනාතන දෙවි දේවතා ධර්මය තිබී අවුරුදු 5000ක් පසු වී ඇත. එය දැන් නැත. ඔවුන් තමෝප්‍රධාන් වී ඇත. පියා ඔහු විසින්ම නිර්මාපකයා හා නිර්මාණය හඳුන්වා දෙයි. කෞතුකාගාර සහ ප්‍රදර්ශන වලට බොහෝ මිනිසුන් ආවත් ඔවුන් කිසිවක් තේරුම් නොගනී. ඉතා කලාතුරකින් සුළු පිරිසක් පාඨමාලාව ලබා ගෙන නිර්මාපකයා හා නිර්මාණය දැන ගනී. අසීමිත පියා නිර්මාණකරුවාය. ඔබ ඔහුගෙන් අසීමිත උරුමයක් ලබාගනී. පියා පමණි ඔබට මෙම ඥානය ලබා දෙන්නේ. එවිට රාජධානිය ලැබුණු විට මෙම ඥානය අවශ්‍ය නොවේ. දෙව් ලොව වන නව ලොව ගැලවීම වන අතර, පරණ වූ ලෝකය වන අපාය දුක්ඛිත වේ. පියා ඔබට ඉතා හොඳින් තේරුම් කර දේ. ඔබත් එසේම තේරුම් කර දිය යුතුය. ඔබ ඔවුන්ට ලක්ෂ්මී නාරායන් පින්තූර පෙන්විය යුතුය. සාමය ලොවේ ඇති වෙමින් තිබේ. පියා සාදන ආදී සනාතන දෙවි දේවතා ධර්මයේ පදනම දැන් නැත. දෙවි දේවතාවුන්ගේ පිරිසිදු ධර්මයක් තිබූ අතර ක්‍රියා ද පිරිසිදු වීය. දැන් මෙය පාපකාරී ලෝකයයි. නව ලෝකය හැඳින්වෙනුයේ පාපයෙන් තොර ලෝකය, ශිවාලය ලෙසය. ඔබ දැන් මෙය තේරුම්කර දුන් විට දුප්පත් අසරණ අයට යහපතක් සිදු වේ. කාරුණිකයාණන් වන්නේ පියා පමණි. ඔහු එන්නේ ඉතා සුබ සංගම් යුගයේදීය. යහපත් පියා යහපත් යුගයේ පැමිණ ඔබට යහපත උදාකර දේ. ඔහු පැරණි ලෝකය වෙනස් කර නව ලෝකය සාදයි. ඥානය තුළින් ගැලවීම ලැබේ. සෑම දිනකම කාලය ලබාගෙන මෙය තේරුම් කර දෙන්න. ඔවුන්ට මෙසේ කියන්න නිර්මාපකයා සහ නිරමාණයේ මුල, මැද සහ අග දන්නේ අප පමණි. දෙවියන් පැමිණ රාජයෝගා උගන්වා අපව ඔටුනු දෙකක් ඇති අය බවට පත් කළ දෙවියන්ගේ කථාව වූ ගීතාව දැන් දිග හැරේ. ලක්ෂ්මී නාරායන් ද එසේ වූයේ රාජයෝගා වලිනි. ඔවුන් පියාගෙන් රාජයෝගා ඉගෙන ගත්තේ ඉතා සුබ වූ සංගම් යුගයේදීය. බාබා සියල්ල ඉතා පහසුවෙන් විස්තර කරයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අප රජවරුන්ගේ රජවරු වන්නේ රාජයෝගා නම් වූ මෙම ඥානයෙන් නිසා රාජයෝගා වූකලී ධනයේ ප්‍රභවයයි. මෙම අධ්‍යාත්මික අධ්‍යයනය ඔබ දිනපතාම උගනිමින් අන් අයට ද ඉගැන්විය යුතුය.
2. සැමවිට අප, මුවින් උපන් සැබෑ බ්‍රාහ්මීණ් අය ලෙස සතුටින් ඉපිල සිටිය යුතුය. අපි කලි යුගයේ අන්ධකාරයෙන් මිදී ආලෝකයට පැමිණ ඇත්තෙමු. අපටත් අන් අයටත් යහපත සිදුකර ගත යුතු වඩාත්ම ශුභ, යහපත් සංගම් යුගය මෙයයි.

**වරදානය:** ඔබ සෑම උසස් සිතිවිල්ලක්ම ක්‍රියාවට නංවන මාස්ටර් සර්වබලධාරී වේවා.

මාස්ටර් සර්වබලධාරී බලධරයෙකු යනු සිතිවිලි සහ ක්‍රියාවන් සමාන වන අයෙකි. ඔබේ සිතිවිලි ඉතා උසස් නමුත් ක්‍රියාවන් එම සිතිවිලි අනුව නොවේ නම්, එවිට ඔබව මාස්ටර් සර්වබලධාරී බලධරයෙකු ලෙස හැඳින්විය නොහැක. එබැවින්, ඔබ තුළ ඇති උසස් සිතිවිලි ක්‍රියාවට නංවන්නේ දැයි පරීක්ෂා කරන්න. මාස්ටර් සර්වබලධාරී බලධරයෙකුගේ සලකුණ වන්නේ ඔහුට ඒ මොහොතට අවශ්‍ය වන බලය භාවිත කිරීමට හැකි වීමයි. ඒ මොහොතේම ඔබට අවශ්‍ය ඕනෑම විශේෂ බලයක් භාවිත කිරීමට හැකි වන පරිදි ඔබේ ශාරීරික හා සියුම් බල පාලනය කර ගන්න.

**පාඨය:** දැනුමෙන් පිරුණු ජීවාත්ම තුළ කෝපය ඇති වූ විට, ඔවුන් පියාගේ නාමය අපකීර්තියට පත් කරයි.

***** ඕම ශාන්ති *****